# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1796/3 - 2013 පෙබරවාරි මස 05 වැනි අඟහරුවාදා - 2013.02.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම් පිළිබඳ නිවේදන

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය : කු/ප්‍රාලේ/16/04/36.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය : LD/05/2009/WS/117

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලපොරොත්තුවන ඉඩමේ විස්තර :-

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩගම්පහ කෝරළයේ සුළු කොට්ඨාසයේ, කෙන්ගල්ල යන ගමේ පිහිටි සර්වේ ජනරාල්වරයා විසින් 2012.12.31 දිනැතිව, මැන සකස් කරන ලද අංක මහ 6220 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන "බලගොල්ල වත්ත" නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0635 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| කැබලි අංකය | : | 1 |
| ඉඩමේ නම | : | බලගොල්ල වත්ත |
| ප්‍රමාණය හෙක්. | : | 0.0635 |

මායිම්

| | | |
|---|---|---|
| උතුරට | : | මු. පි. මහ 2712 හි කැබලි අංක 69 ; |
| නැගෙනහිරට | : | මු. පි. මහ 2712 හි කැබලි අංක 69 ; |
| දකුණට | : | මු. පි. මහ 2712 හි කැබලි අංක 69 ; |
| බටහිරට | : | මු. පි. මහ 2712 හි කැබලි අංක 69. |

හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය :

1. පූජ්‍ය තල්පොත ධම්මජෝති හිමි,
බෞද්ධ මධ්‍යස්ථානය,
බලගොල්ල,
කෙන්ගල්ල.

2. මහා භාරකරු,
මහා භාරකාර දෙපාර්තමේන්තුව,
කොළඹ 07

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවළුන් හෝ 2013.04.03 දින පෙ.ව. 10.00 ට කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2013.03.27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදි ඉදිරිපත් කළ යුතුය.

එල්. ඒ. ඩී. ගීතා ඉන්ද්‍රානි,
ප්‍රාදේශීය ලේකම්,
කුණ්ඩසාලේ.

කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 627

---

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය :ව/18/83/2008

මා විසින් 2011.06.02 වැනි දින අංක 1708/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි පල කරන ලද ඉඩම් රජයට අත්පත් කර ගැනීම පිළිබඳ 7 වැනි වගන්තිය යටතේ දැන්වීම මෙහි පහත දැක්වෙන පරිදි සංශෝධනය කරන ලදී.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රාගම්පත්තුව සුළු කොට්ඨාසයේ, උස්වැටකෙයියාව ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු අංක මූ. පි. ගම්. 3740 දරන 2010.08.20 දිනැති පිඹුරේ කැබලි අංක 01,02,03 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.9013 ක් වූ මාදන්ගහවත්ත යනුවෙන් පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි තුන :

01. කැබලි අංක : 1

| | | |
|---|---|---|
| ඉඩමේ නම | : | මාදන්ගහවත්ත |
| විස්තරය | : | වත්ත, අවුරුදු 35 ක් පමණ වයසැති පොල්ගස් 34ක් සහ අවුරුදු 12 ක් පමණ වයසැත් සියඹලා ගසක් ඇත. |
| හිමිකම් කියන අය | : | රජය |
| ප්‍රමාණය හෙක්. | : | 0.4057 |

02. කැබලි අංක : 2

| | | |
|---|---|---|
| ඉඩමේ නම | : | මාදන්ගහවත්ත |
| විස්තරය | : | වත්ත, අවුරුදු 35 ක් පමණ වයසැති පොල්ගස් 30ක් ඇත. (ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් සාදන ලද ස්ථිර ගොඩනැගිලි 2ක් සහ මුර කුටියක් ඇත.) |
| හිමිකම් කියන අය | : | රජය |
| ප්‍රමාණය හෙක්. | : | 0.3744 |

03. කැබලි අංක : 3

| | | |
|---|---|---|
| ඉඩමේ නම | : | මාදන්ගහවත්ත |
| විස්තරය | : | වත්ත, අවුරුදු 35 ක් පමණ වයසැති පොල්ගස් 10ක් ඇත. (ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් සාදන ලද ස්ථිර ගොඩනැගිලිලක් ඇත.) |
| හිමිකම් කියන අය | : | රජය |
| ප්‍රමාණය හෙක්. | : | 0.1212 |

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවළුන් හෝ 2013.03.30 දින පෙ.ව. 10.00 ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2013.03.23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

චන්දිමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2013 ජනවාරි මස 28 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 628

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

මගේ අංකය ෴ දො/ඉ/1/අත්/අධි/96

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉද්දගොඩපත්තුව සුළු කොට්ඨාසයේ ලියනගොඩ ගමේ, මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක ක 4348 සහ 2012.12.31 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0389 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල ෴

**1. කැබලි අංක 1**

ඉඩමේ නම පෙට්ටිගලලන්දවත්ත විස්තරය විවෘත මුඩුබිම හිමිකම් කියන අය රජය මුල් හිමිකම් කියන අය : ඩබ්.ඩී.වයි.ආර්. ගුණරත්න නො. 33/9, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව සහ ඩබ්.ඩී.ඒ.පී. ගුණරත්න, නො.15/4, ග්‍රේස් පීරිස් මාවත, පානදුර ප්‍රමාණය : හෙක් 0.0389.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2013 අප්‍රේල් මස 08 වැනි දින පූ.භා 10.00 ට දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2013 අප්‍රේල් මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්.ඩබ්.ටී.ආර්. වෙත්තසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
දොඩන්ගොඩ.

2012 ජනවාරි මස 16 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 636

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.